# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත

---

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 මාර්තු මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 25 වන දින.]

එල්. ඩී.—ඕ. 92/79.

**පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන ඇතැම් වැරදි සම්බන්ධයෙන් ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*පොදු දේපළ විෂයයෙහි ලා අනර්ථය සිදු කිරීම.*

2. පොදු දේපළ විෂයයෙහි ලා අනර්ථය නමැති වරද සිදු කරන්නා වූ කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු එකකට නොඅඩු එහෙත් අවුරුදු විස්සක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ද රුපියල් එක් දහසක් හෝ ඒ වරද සිදු කරන ලද්දේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළට සිදු කරන ලද අලාභයේ හෝ හානියේ ප්‍රමාණය මෙන් තුන් ගුණයක් හෝ යන මේ දෙකින් වැඩි මුදල විය යුතු දඩයකින් ද ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

*පොදු දේපළ සොරකම් කිරීම.*

3. පොදු දේපළ සොරකම් කිරීම පිළිබඳ වරද සිදු කරන්නා වූ කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු එකකට නොඅඩු එහෙත් අවුරුදු විස්සක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ද රුපියල් එක් දහසක් හෝ ඒ වරද සිදු කරන ලද්දේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළෙහි වටිනාකම මෙන් තුන් ගුණයක් හෝ යන මේ දෙකින් වැඩි මුදල විය යුතු දඩයකින් ද ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

*පොදු දේපළ කොල්ලකෑම.*

4. පොදු දේපළ කොල්ලකෑම පිළිබඳ වරද සිදු කරන්නා වූ කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු එකකට නොඅඩු එහෙත් අවුරුදු විස්සක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ද රුපියල් එක් දහසක් හෝ ඒ වරද සිදු කරන ලද්දේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළෙහි වටිනාකම මෙන් තුන් ගුණයක් හෝ යන මේ දෙකින් වැඩි මුදල විය යුතු දඩයකින් ද ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

*වංක ව්‍යාපහරණය, සාපරාධ විශ්වාස කඩ කිරීම, වංචා කිරීම, ව්‍යාජ ලේඛන සෑදීම සහ හිඟුම් වරදවා පෙන්වීම.*

5. (1) යම් චංචල පොදු දේපළක් වංක ලෙස ව්‍යාපහරණය කරන්නා වූ හෝ තම ප්‍රයෝජනයට යොදා ගන්නා වූ නැතහොත් යම් චංචල පොදු දේපළක් සම්බන්ධයෙන් සාපරාධ විශ්වාස කඩ කිරීමේ වරද සිදු කරන්නා වූ කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු එකකට නොඅඩු එහෙත් අවුරුදු විස්සක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ද රුපියල් එක් දහසක් හෝ ඒ වරද සිදු කරන ලද්දේ යම් දේපළක්

1—ඒ 61110—15,825 (82/01)

සම්බන්ධයෙන් ද ඒ දේපළෙහි වටිනාකම මෙන් තුන් ගුණයක් හෝ යන මේ දෙකින් වැඩි මුදල විය යුතු දඩයකින් ද ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

(2) පොදු දේපළවලට අදාළව වංචා කිරීමේ, ව්‍යාජ ලේඛන සෑදීමේ හෝ ගිණුම් වරදවා පෙන්වීමේ වරද සිදු කරන කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු එකකට නොඅඩු එහෙත් අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ද රුපියල් එක් දහසක් හෝ ඒ වරද සිදු කරන ලද්දේ යම් මුදලක් සම්බන්ධයෙන් ද ඒ මුදල මෙන් තුන් ගුණයක් හෝ යන මේ දෙකින් වැඩි මුදල විය යුතු දඩයකින් ද ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

දේපළ රාජසන්තක කිරීමෙන් දඩය අයකර ගැනීම.

6. යම් තැනැත්තකු වෙත 2 වන, 3 වන, 4 වන, 5 වන හෝ 10 වන වගන්ති යටතේ නියම කරන ලද යම් දඩයක් ඒ තැනැත්තා විසින් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, පැහැර හැරීම කළ ඒ තැනැත්තා සතු ඒ දඩයේ ප්‍රමාණයට වටිනාකමින් සමාන යයි අධිකරණය විසින් සලකනු ලබන සියලු චංචල හෝ නිශ්චල දේපළ ජනරජය වෙත රාජසන්තක විය යුතු බවට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය. තවද ඒ දේපළ විකිණීමෙන් එම දඩ මුදලෙහි ප්‍රමාණයට වැඩියෙන් ලැබෙන යම් මුදලක් ඒ තැනැත්තා වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

ප්‍රජා සේවා ආඥාව.

7. 6 වන වගන්තිය යටතේ දේපළ රාජසන්තක කිරීම, ක්‍රියාත්මක කළ නොහැකි හෝ අවස්ථානුකූල නොවන හෝ අවස්ථාවක, එවැනි රාජසන්තක කිරීමේ ආඥාවක් කිරීම වෙනුවට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 18 වන වගන්තිය යටතේ ප්‍රජා සේවා ආඥාවක් අධිකරණය විසින් කළ හැකි ය.

ඇප දීම සම්බන්ධයෙන් අදාළ විධිවිධාන.

8. (1) මේ පනත යටතේ වරදක් සිදු කර ඇති බවට හෝ වරදක් සිදු කිරීමෙහි ලා සම්බන්ධ වූ බවට හෝ වරදක් සිදු කරන ලදැයි සැක කරනු ලබන බවට නැතහොත් වරදක් සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී යයි සැක කරනු ලබන බවට වූ චෝදනාවක් මත යම් තැනැත්තකු යම් අධිකරණයකට භාර වන්නා වූ නැතහොත් සිර භාරයට ගනු ලැබ යම් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලබන්නා වූ අවස්ථාවක, ඇප සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අදාළ විය යුතු ය:

එසේ වුව ද, වරද සිදු කරන ලද්දේ යම් විෂය වස්තුවක් සම්බන්ධයෙන් ද, ඒ විෂය වස්තුවෙහි වටිනාකම රුපියල් පන් දහසක් ඉක්මවන බවට සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට පහත් නොවන නිලයකට අයත් රාජ්‍ය නිවේදිත නිලධරයකු විසින් සහතික කරනු ලබන අවස්ථාවක, නඩු විභාගය අවසන් කරනු ලබන තෙක් ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයෙහි තබා ගනු ලැබිය යුතුය. අසාමාන්‍ය අවස්ථාවල දී ඇප පිට මුදා හැරීමට හේතු සටහන් කිරීමෙන් පසුව ඒ තැනැත්තා ඇප පිට මුදා හැරීමට අධිකරණයට බලය තිබිය යුතුය.

(2) අධිකරණය විසින් මේ පනත යටතේ වූ යම් වරදකට වරද කරු කරනු ලැබූ තැනැත්තකු විසින් ඔහු වරදකරු කරනු ලැබීමට විරුද්ධව හෝ ඔහුට නියම කරන ලද දණ්ඩන නියමයට විරුද්ධව හෝ අභියාචන පෙත්සමක් ඉදිරිපත් කර ඇත්තේ වුව ද ඒ සෑම තැනැත්තකු ම අභියාචනය නිශ්චය කරනු ලබන තෙක් රිමාන්ඩ් භාරයේ තබා ගනු ලැබිය යුතු ය:

එසේ වුව ද අසාමාන්‍ය අවස්ථාවල දී, ඇප පිට මුදා හැරීමට හේතු සටහන් කිරීමෙන් පසු ඒ තැනැත්තා ඇප පිට මුදා හැරීමට ඒ අධිකරණයට බලය තිබිය යුතු ය.

මේ පනත යටතේ වූ වැරදි හා සම්බන්ධ නඩු විභාගවලට සහ වරදකරු කිරීම්වලට විරුද්ධව කරනු ලබන අභියාචනවලට ප්‍රමුඛතාව දිය යුතු බව.

9. මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ යම් තැනැත්තකුගේ නඩු විභාගයට සහ එවැනි යම් වරදකට වරදකරු කිරීමට හා ඒ වරදකරු කිරීම සම්බන්ධයෙන් නියම කරන ලද දණ්ඩන නියමයට විරුද්ධව වූ යම් අභියාචනයක් විභාග කිරීමෙහි ලා අධිකරණය විසින් ප්‍රමුඛතාව දෙනු ලැබිය යුතු ය.

වැරදි සිදු කිරීමට තැත් කිරීම.

10. මේ පනත යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සිදු කිරීමට තැත් කරන්නා වූ හෝ එවැනි වරදක් සිදු කිරීමට සලස්වන්නා වූ හා ඒ තැත් කිරීමේ දී වරද සිදු කිරීම සඳහා යම් ක්‍රියාවක් කරන්නා වූ යම් තැනැත්තකුට වරද සඳහා සලසා ඇති දෙයාකාරයෙන් එක් ආකාරයකින් වූ යම් බන්ධනාගාරගත කිරීමකින් සහ වරද සඳහා සලසා ඇති යම් දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු ය.

වයස අවුරුදු දහසයට අඩු තැනැත්තන්ට දඬුවම් කිරීම.

11. වයස අවුරුදු දහසයට අඩු යයි අධිකරණය අදහස් කරන තැනැත්තකු විසින්, 2 වන, 3 වන, 4 වන හෝ 5 වන වගන්ති යටතේ වරදක් සිදු කරනු ලබන හෝ 10 වන වගන්තිය යටතේ වරදක් සිදු කිරීමට තැත් කරනු ලබන හෝ වරදක් සිදු කිරීමට සලස්වනු ලබන අවස්ථාවක, ඒ වරද සඳහා නියම කර ඇති අවම දඬුවම නොසලකා දඬුවමක් පැනවීමේ අභිමතය අධිකරණය වෙත තිබිය යුතු ය.

අර්ථ නිරූපණය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

“ බැංකුව ” යන්නෙන්—

(අ) ණය හෝ අත්තිකාරම් හෝ ආයෝජන ප්‍රදානය කරන තැනහොත් මහජනයාගේ මුදල් තැන්පතු භාර ගන්නා, ආණ්ඩුව වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ (යම් ලිඛිත නීතියක් යටතේ හෝ අන්‍යාකාරයකින් පිහිටුවන ලද) යම් නියෝජිතායතනයක් හෝ ආයතනයක් ; සහ

(ආ) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, මේ පනතේ කාර්ය සඳහා බැංකුවක් ලෙස මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරන ලද වෙනත් යම් ආයතනයක් හෝ පුද්ගල මණ්ඩලයක්

අදහස් වේ ;

"වංචා කිරීම" යන්නෙහි, දණ්ඩ නීති සංග්‍රහයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"සාපරාධ විශ්වාස කඩ කිරීම" යන්නෙහි, දණ්ඩ නීති සංග්‍රහයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"සමුපකාර සමිතිය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත හෝ තත් කාලයෙහි බලපවත්නා ඊට සම්බන්ධ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ලියාපදිංචි කරන ලද නැතහොත් ලියාපදිංචි කරන ලදැයි සලකනු ලබන යම් සමිතියක් අදහස් වේ ;

"සමුපකාර සංගමය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත හෝ තත් කාලයෙහි බලපවත්නා ඊට සම්බන්ධ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ලියාපදිංචි කරන ලද නැතහොත් ලියාපදිංචි කරන ලදැයි සලකනු ලබන යම් සංගමයක් අදහස් වේ ;

"වංක ලෙස" යන්නෙහි, දණ්ඩ නීති සංග්‍රහයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"වරදවා පෙන්වීම" යන්නෙහි, දණ්ඩ නීති සංග්‍රහයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"ව්‍යාජ ලේඛන සෑදීම" යන්නෙහි, දණ්ඩ නීති සංග්‍රහයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"අනර්ථය" යන්නෙහි, දණ්ඩ නීති සංග්‍රහයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;

"පොදු දේපළ" යන්නෙන්, ආණ්ඩුවේ දේපළ ද, යම් දෙපාර්තමේන්තුවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රාජ්‍ය සංස්ථාවක, බැංකුවක, සමුපකාර සමිතියක හෝ සමුපකාර සංගමයක දේපළ ද අදහස් වේ ;

"කොල්ලකෑම" යන්නෙහි, දණ්ඩ නීති සංග්‍රහයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"සොරකම" යන්නෙහි, දණ්ඩ නීති සංග්‍රහයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.